සැ. යු.-2008.07.04 දින පළ කරන ලද අංක 1,557 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,558 - 2008 ජූලි මස 11 වැනි සිකුරාදා - 2008.07.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 780 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 781 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ජූලි මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජූලි මස 04 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.

ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.

iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසංණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. වැටුප් ක්‍රමය මාසිකව.- රු. 33,335 - 3x790 - 17x1,050 - රු. 53,555

04. *වයස* .- අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30ට නොඅඩු වීම හා 40ට නොවැඩි වීම (රජයේ, සංස්ථා සේවයේ නියුක්ත නිලධරයන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. *සුදුසුකම්* :

(අ) තනතුරෙහි ස්ථිර කරනු ලැබ සිටින ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු වීම ;

හෝ

(ආ) වර්ෂයකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියෙහි යෙදී සිටි නීතිඥවරයෙකු වීම.

*සටහන.*—යම් අමාත්‍යාංශයක රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නීතිඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳ ගුරුවරයෙකු වශයෙන් හෝ සේවය කළ කාලපරිච්ඡේදය ඉහත (ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව සඳහා ක්‍රියාකාරී ලෙස වෘත්තියෙහි යෙදී සිටි කාලයක් ලෙස සලකණු ලැබේ.

06. *සෑම අයදුම්කරුවෙක්ම* —

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය ;

(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

07. පහත සඳහන් ලිපිලේඛන වලින් එකක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකි විය යුතුය :

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඉ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඊ) සිංහලෙන් / දෙමළෙන් / ඉංග්‍රීසියෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

08. මෙම තනතුර සඳහා අයදුම්කරන්නන් මෙහි සඳහන් ආදර්ශ ආකෘතිය අනුවම අයදුම්පත පිළියෙල කළ යුතු අතර එය 2008.08.11 වැනි දින හෝ එදිනට පෙර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව, කොළඹ 12 යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

09. රජයේ / රාජ්‍ය සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

10. අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් එවීමෙන් සතියක් ඇතුළත එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණහොත් අයදුම්කරු විසින් ලේඛනගත තැපැල් කුවිතාන්සිය ඉදිරිපත් කර මෙම කාර්යාලයෙන් ඒ සම්බන්ධව විමසිය යුතුය.

පී. ඩබ්. ඩී. සී. ජයතිලක,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2008 ජුනි මස 16 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත්‍රය

01. 1. මුලකුරු සමග නම :————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

02. 1. ස්ථිර ලිපිනය :————.
2. කාර්යාලයීය ලිපිනය :————.

03. ජනවර්ගය :————.

04. 1. උපන් දිනය :————.
2. අයදුම්පත භාරගන්නා අවසාන දිනට වයස :
අවු. :————. මාස :————. දින :————.

05. 1. ස්ත්‍රී පුරුෂ භාවය :————.
2. විවාහක ? අවිවාහක ද ? වැන්දඹු ද? :————.
3. දරුවන් ගණන :————.
4. පුත්තු ද ? දූවරු ද ? යන්න සහ ඔවුන්ගේ වයස :————.

06. ඉදිරිපත් කරන අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම් :————.

07. සමත් වී ඇති උසස්ම විභාගය :
1. සිංහලෙන් :————.
2. දෙමළෙන් :————.
3. ඉංග්‍රීසියෙන් :————.

08. ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් නම්,

1. එම තනතුරට පත් වූ දිනය :————.
2. සේවය ස්ථිර කළ දිනය :————.
3. එම තනතුරට පත්වීමට පෙර දැරූ තනතුර :————.
4. රජයේ / සංස්ථා සේවය නම් මුළින්ම පත් වූ තනතුර හා දිනය :————.
5. වර්තමාන වාර්ෂික වැටුප :————.

(09 සිට 17 දක්වා ඇති කරුණු නීතිඥවරයෙකු වශයෙන් ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන අයදුම්කරුවකු විසින් පමණක් සම්පූර්ණ කළ යුතුය.)

09. 1. නීතිඥ වෘත්තියට බඳවා ගන්නා ලද දිනය :————.
2. ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය දින සඳහන් කරමින් :————.
3. පසුගිය අවුරුද්ද තුළ වෘත්තියෙන් ලැබූ සාමාන්‍ය ආදායම :————.

4. ඔබ නිතර පෙනී සිටින අධිකරණ :————.
5. ඔබ නිතර පෙනී සිටින විනිශ්චයකාරවරුන් තිදෙනෙකුගේ නම් :————.
6. ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී නොමැති නම් නීතිඥවරයෙකු වශයෙන් බඳවා ගැනීමෙන් පසු කරන ලද වෘත්තීන්, දැරූ තනතුරු දින හා වාර්ෂික වැටුප :————.

10. පෞද්ගලික ආදායම ඇතොත් ;
(i) ලැබෙන මාර්ග :————.
(ii) වාර්ෂික ආදායම :————.

11. පසුගිය අවුරුදු 10 තුළ ඔබ දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද ? :————.

12. මෙම තනතුර සඳහා මීට පෙර ඔබ අයදුම්කර තිබේද? (එසේ නම් එම වර්ෂය සඳහන් කරන්න.) :————.

13. ඔබ ආදායම් බදු ගෙවන අයෙක් ද :————.

14. ඔබගේ පෞද්ගලික තොරතුරු විමසිය හැකි දෙදෙනෙකුගේ නම් පහත සඳහන් කරන්න. ඒ අය ඔබ ගැන දන්නා වගකිවයුතු පුද්ගලයන් විය යුතුය ඃ
(i) නම :————.
(ii) තනතුර :————.
(iii) ලිපිනය :————.

(1) නම :————.
(ii) තනතුර :————.
(iii) ලිපිනය :————.

15. ඔබට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් හෝ චෝදනාවක් දැනට තිබේද ? මීට පෙර තිබුණේ ද ? එහි ස්වභාවය සඳහන් කරන්න:————.

16. ඔබ රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීමකින් හැර අන් අයුරකින් සේවය අතහැර ගිය අයෙක් වේද ? :————.

17. ඔබගේ කුසලතාවය පිළිබඳ ලබාගත් සහතික ඇතොත් සඳහන් කරන්න. :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය බැව් හෝ වැරදි බැව් හෝ මා තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුස්සෙකු වීමට ද, මෙම තනතුරට මා පත්කරගැනීමෙන් පසුව එම වරද දැන ගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බැව් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

...................... මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අධිකරණයේ, දෙපාර්තමේන්තුවේ, අමාත්‍යාංශයේ, සංස්ථාවේ, ................................ තනතුරෙහි සේවය කරන බැව් ද, ඔහු/ ඇය විසින් ඉහත සඳහන් කරනු ලැබ ඇති කරුණු නිවැරදි බව ද සහතික කරමි..................... මහතා/ මහත්මිය/මෙනවිය මෙම තනතුර සඳහා තේරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි බව ද, දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.

නිලමුද්‍රාව. :————.

දිනය :————.

07 -117

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**යොවුන් සේනාංකය—තරුණ කටයුතු අමාත්‍යාංශය**

යොවුන් සේනාංක රේන්ජර් පුහුණු මධ්‍යස්ථාන සඳහා
ආධුනිකයින් බඳවා ගැනීම - 2008
"අසිරිමත් පරපුරක් උදෙසා සදාතනික නවාතැනක්"

1. පාසල් අධ්‍යාපනය නිමකර සිටින ඔබට සාර්ථක අනාගතයකට අවශ්‍ය දැනුම, පෞරුෂත්ව සංවර්ධනය, භාෂා කුසලතා සංවර්ධනය සහ පරිගණක සාක්ෂරතාවය ලබා දෙමින්, ඔබේ අනාගත ඉලක්ක විශිෂ්ඨ ලෙස ජය ගැනීම සඳහා අවශ්‍ය සවිමත් පදනම "පාසැලෙන් වැඩ බිමට" තේමාව යටතේ ගොඩනැගීම යොවුන් රේන්ජර් වැඩසටහනේ මූලික අරමුණයි. මෙරට හා පිටරට රැකියා ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් මෙන්ම ආත්ම අභිමානයෙන් යුතුව ඔප් නැංවූ සහජ හැකියා තුළින් අනාගතය සර්ථක කර ගැනීමට බලාපොරොත්තු වන තරුණ තරුණියන්ට මෙම වැඩසටහන සඳහා අයදුම් කල හැක.

2. බඳවා ගැනීමේ සුදුසුකම් ඃ-
* 2008.07.16 දිනට වයස අවුරුදු 17 ත් 28 ත් අතර වයස් කාණ්ඩයට අයත් වීම.
* පාසල් අධ්‍යාපනය නිමකර තිබීම හා අවම වශයෙන් අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටීම.
* බාලදක්ෂ, ශිෂ්‍ය භට, ක්‍රීඩා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී තිබීම විශේෂ සුදුසුකමකි.

3. පුහුණු පාඨමාලා ආරම්භ කරන දිනයන් ඃ-
* 2008 ජූලි මස 16 වැනි දින

4. පාඨමාලාවේ සංයුතිය ඃ-
* ආයතනික පුහුණුව (සියලු වැඩ කරන දිනයන්හි උදෑසන 07.30 සිට සවස 04.30 දක්වා)
* සව්බල ගැන්වීම
* මාස 06 ක ආයතනික පුහුණුව අවසානයේ වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම

*ආයතනික පුහුණුව*

* භාෂා නිපුණත්වය (ඉංග්‍රීසි සහ දෙමළ)
* පරිගණක පුහුණුව
* සණ සරඹ හා ශාරීරික අභ්‍යාස.
* වෘත්තීය මර්ගෝපදේශනය හා උපදේශනය
* සමාජ විද්‍යාව
* ජාතික උරුමය
* සෞන්දර්යය අධ්‍යාපනය (නර්ථනය, සංගීතය, චිත්‍ර කලාව)
* පෞරුෂ සංවර්ධනය

*සවිබල ගැන්වීම*

* බැහැරගත පුහුණුව
* ව්‍යවසායකත්ව සංවර්ධනය
* ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම්
* පුද්ගල හා සමූහ පැවරුම්
* ජීවනෝපාය සංවර්ධනය
* භාවනා මගින් මානසික ඒකාග්‍රතාවය

5. ඔබට ලැබෙන ප්‍රතිලාභ :-

* කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම.
* මාස 06 ක පුහුණු කාලය තුළ මසකට රු.1000 බැගින් දිරි දීමනාවක් ගෙවීම.
* නිළ ඇඳුම් ලබා දීම.
* පුහුණු කාලය තුළ උදේ හා දිවා ආහාරය හා තේ පැන්
* ක්‍රීඩා සම්බන්ධ පුහුණු වැඩමුළු, තරුණ කඳවුරු සඳහා සහභාගීත්වය
* පුහුණුව අවසානයේ පිළිගත් සහතිකයක් ලබා දීම

6. අයදුම්පත් යොමු කිරීම :-

ආදර්ශ අයදුම්පත අනුව ඔබ විසින් සකස් කල ඉල්ලුම් පත් 2008.07.15 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ආසන්නතම යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වෙත යොමු කරන්න.

7. සම්මුඛ පරීක්ෂණය :-

යොවුන් සේනාංක වැඩසටහන සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය ඔබ විසින් ඉල්ලුම් කල යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේදී 2008.07.07 දින පෙ.ව. 9.00 සිට පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය අවසානයේ තෝරාගත් අයදුම්කරුවන්ට ඒ බව දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ,
යොවුන් සේනාංකය.

යොවුන් සේනාංක මූලස්ථානය,
අංක 974/4,
පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

දුරකථන අංක :

060-2152660
060-2152661
060-2152662
060-2152663
060-2152664

*යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ලේඛනය*

| | *යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ නම* | *යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයේ ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|
| 1 | බියගම | හෙයියන්තුඩුව, මාකොළ දකුණ, මාකොළ | 011-2964040 |
| 2 | කටුනායක | ධම්මාලෝක මාවත, වලානගොඩ, කටුනායක | 011-2260020 |
| 3 | අත්තනගල්ල | වතුපිටිවල, අත්තනගල්ල, නිට්ටඹුව | 033-2282232 |
| 4 | දොම්පේ | නැදුන්ගොල්ලවත්ත, මණ්ඩාවල, දොම්පෙ | 060-2339834 |
| 5 | යක්කල | වැරැල්ලවත්ත, යක්කල, ගම්පහ | 033-2233534 |
| 6 | දිවුලපිටිය | වල්පිට, හෙට්ටිපොල, දිවුලපිටිය | 033-2272875 |
| 7 | බුලත්සිංහල | බුලත්සිංහල | 034-2282322 |
| 8 | ගම්පොල | ගුරු අභ්‍යාස විද්‍යාලය, ගම්පොල | 081-2352335 |
| 9 | නාවුල | අරන්ගල, නාඋල | 066-2246204 |
| 10 | දඹුල්ල | ඉනාමළුව, දඹුල්ල | 066-2286177 |
| 11 | නුවරඑළිය | මිපිළිමාන, අඹේවෙළ, නුවරඑළිය | 060-2536332 |
| 12 | හගුරන්කෙත | රිකිල්ලගස්කඩ, හගුරන්කෙත | 081-2365849 |
| 13 | ගාල්ල | වැකුණුගොඩ, බෝපේ, ගාල්ල | 091-2233182 |
| 14 | අක්මීමණ | ඉහලගොඩ, වලහන්දූව, අක්මීමණ | 091-2239595 |
| 15 | අකුරැස්ස | මාරඹ, අකුරැස්ස | 041-4921003 |
| 16 | එරමිණියාය | හුංගම, එරමිණියාය | 060-2489156 |
| 17 | වීරකැටිය | නයිගල, හකුරුවෙල, වීරකැටිය | 047-2257143 |
| 18 | සූරියවැව | සූරියවැව, තිස්සමහාරාමය | 047-2288169 |
| 19 | කන්තලේ | සිනිපුර. කන්තලේ | 026-2244088 |
| 20 | කුලියාපිටිය | දෙගම්මැද, වැවගම, කුලියාපිටිය | 060-2879228 |
| 21 | වාරියපොල | උසාවි මාවත, වාරියපොල | 060-2973575 |
| 22 | මාවතගම | ඩෙන්වෝර්වත්ත, මාවතගම | 037-2298668 |
| 23 | පඬුවස්නුවර | නුගවැල හන්දිය, තුත්තිරිපිටිගම, පඬුවස්නුවර | 037-2291803 |
| 24 | දොඩන්ගස්ලන්ද | අලකොළමඩ, මදුරාගොඩ, දොඩන්ගස්ලන්ද | 037-4924982 |
| 25 | නාත්තන්ඩිය | සාගරගම, නාත්තන්ඩිය | 032-5673377 |
| 26 | කැකිරාව | මහවැලි පෙදෙස, කැකිරාව | 025-2263297 |
| 27 | කලාවැව | ගල්නෑව, බුල්නෑව, කලාවැව | 025-2269946 |
| 28 | පාලාඩිකුලම් | පාලාඩිකුලම්, අනුරාධපුරය | 060-2852809 |
| 29 | අරලගංවිල | හංසයා පාලම, අරලගංවිල, පොළොන්නරුව | 060-2279016 |
| 30 | බණ්ඩාරවෙල | බිදුණුවැව, බණ්ඩාරවෙල | 057-2222214 |
| 31 | මහියංගනය | මාපාකඩවැව, මහියංගනය | 055-2257059 |
| 32 | තණමල්විල | සර්වෝදය මධ්‍යස්ථානය, තණමල්විල | 060-2483112 |
| 33 | නිවිතිගල | අම්බලන්දෙනිය, වටාපොත පාර, නිවිතිගල | 045-2279970 |
| 34 | බටංගල | බටංගල, පනාවල, දැරණියගල | 036-2258108 |
| 35 | ගලිගමුව | ආසිදෙණිය, ගලිගමුව | 060-2359735 |
| 37 | කෑගල්ල | ගංගොඩවත්ත, කෑගල්ල | 060-2352600 |

**යොවුන් සේනාංකය - අයදුම් පත්‍රය**

1. දිස්ත්‍රික්කය : [ ] 2. ඡන්ද කොට්ඨාශය : [ ]

3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : [ ] 4. ග්‍රාම නිලධාරි කොට්ඨාශය : [ ]

5. පුහුණුවීම සඳහා ඉල්ලුම් කරන යොවුන් දිරිය පුහුණු මධ්‍යස්ථානයේ නම : [ ]

6. සම්පූර්ණ නම පෙළපත් නාමය සමඟ (ජාතික හැඳුනුම්පතේ සඳහන් පරිදි) :

[ ]

7. මුලකුරු සමඟ නම(ඉංග්‍රීසි අකුරුවලින්) : [ ]

[ ]

8. ස්ථිර ලිපිනය : [ ]

9. උපන් දිනය : [ ]

2008. 07. 16 දිනට වයස : අවු: [ ] මාසඃ [ ] දින: [ ]

10. ජාතික හැඳුනුම්පත් අංකය : [ ] 11 ස්ත්‍රී පුරුෂ භාවය : [ ]

12. අධ්‍යාපන සුදුසුකම් :
1. අ. පො. ස (උ/පෙ) සමත් [ ] 2. අ. පො. ස (සා/පෙ) [ ]

13. අනෙකුත් බාහිර ක්‍රියාකාරකම් : [ ]

(පාසල් ශිෂ්‍ය නායක, ක්‍රීඩා නායක, නිවාසාන්තර, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමේ ක්‍රීඩා කරන සහ සමිති සමාගම් ස්වේච්ඡා සංවිධාන, දහම් පාසල්වල කටයුතු කර ඇත්නම් එම තොරතුරු)

14. නිර්මාණශීලී ක්‍රියාකාරකම් : [ ]

15. දැනට රැකියාවක නිරතවන්නේනම් ඒ පිළිබඳ විස්තර : [ ]

16. අනාගත වෘත්තීය අපේක්ෂාව

1. රාජ්‍ය අංශයේ රැකියාවක් : [ ] 2. පෞද්ගලික අංශයේ රැකියාවක් : [ ]

3. තමාගේම ව්‍යාපාරයක් : [ ] 4. විදේශ රැකියාවක් : [ ]

5. සහජ හැකියාවට රැකියාවක් : [ ] 6. වෙනත් : [ ]

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවටත් මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය: [ ] අයදුම්කරුගේ අත්සන: [ ]

07-136

---

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

*ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන පරිගනක මුද්‍රණ රටා (සිත්තම්) නිර්මාණය පිළිබඳ පාඨමාලාව*
***Certificate Course in Computer Graphic Designing***

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥාපනතක් මඟින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් ග්‍රැෆික් පාඨමාලාව 2008 ජුලි මස අවසානයේදී ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මඟින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාවන් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

**පරිඝණක ආශ්‍රිත රූ රටා නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

**Certificate Course in Computer Graphic Designing**

මෙම පාඨමාලාව ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත්වීමට බලාපොරොත්තු වන නවකයින්ට මෙන්ම එම ක්ෂේත්‍රයන්හි නියැලී සිටින සේවක මහතුන් සඳහා විශේෂයෙන් සැකසුණ පාඨමාලාවකි. පරිඝණක ආධාරයෙන් ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාල මෘදුකාංග පිළිබඳ පුළුල් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ද ලබාදෙයි.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | - | පැය 144 යි (මාස 4) |
| මාධ්‍යය | - | සිංහල/ඉංග්‍රීසි |
| ගාස්තුව | - | රු. 12,000 |
| වේලාවන් | - | සතිපතා සහ සති අන්ත පන්ති කිපයක් පැවැත්වේ. |

**Course Outline**

* **Introduction to Computers**
  (Hard Ware and Soft Ware for Graphics Industry)
* Introduction to **Adobe-Indesign** for Page Make-up
* Creating and Designing Vector Graphics Using **Macro Media Free Hand**
* Creating and Designing Vector Graphics using **Corel Draw**

* Creating and Designing Vector Graphics using **Adobe Illustrator**

* **Light and Colour**
Colour Theory and Colour management, Pantone Traditional CMYK and Hexachrome Colour management Systems.

* How to use **Adobe Photoshop** as a Raster Graphic Image manipulation application
Photoshop and Tools
Image Correction and Image Manipulation
Colour Corrections and Adjustment
2D-3D in Photoshop
Image Modes and Blending Modes
Photoshop inbuilt and Third party plug-in Filters
Using Layers, Channels and Basic Palettes
Working with Paths and vector shapes
Masking Systems in Photoshop

* **Scanning Technology** : How to use Scanner for printing Technology (From Black and White to Colour)

* **Out Put Techniques** : Colour Separations and Special Colour out putting

* Visit to Industry Bureaus and Printing Houses to understand the operations of Image Setters and Printing Processors.

මෙම පාඨමාලාවන්ට ඇතුළත් වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට පමණක් පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබෙන අතර පහත දුරකථන අංක වලින් අමතා සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනයක් වෙන්කර ගන්න. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

*විමසීම්* : ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන අංක : 2686162/2679791/ෆැක්ස් අංකය : 2686162.
ඊමේල් : sliopreg@sltnet.lk

07-165/1

---

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මාතලේ සහ බේරුවල ශාඛා පාඨමාලා**

තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන කොළඹ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති ශාඛාවන් මගින් පහත සඳහන් පාඨමාලා 2008 ජූලි මස අවසානයේදී නැවතත් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

අද පවතින රැකියා ඉල්ලුමට සරිලන පරිදි පරිගණක මුද්‍රණ රටා නිර්මාණය (Computer Graphic Desigining) පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති අතර මෙම පාඨමාලා සාධාරණ මිලකට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මාතලේ සහ බේරුවල ශාඛා තුළින් හඳුන්වා දෙයි.

**පරිගණක ආශ්‍රිත රූ රටා නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**
Certificate Course in Computer Graphic Desigining

*පාඨමාලා අන්තර්ගතය* :

* Hard Ware and Soft Ware for Graphic Industry
* Introduction to Adobe Indesign for Page Make-up
* Creating and Designing Vector Graphics using Macro Free Hand
* Creating and Designing Vector Graphics using Corel Draw
* Creating and Designing Vector Graphics using Adobe Illustrator
Colour Theory and Colour Management, Pantone Traditional CMYR and Hexchrme Colour Management Systems
* Adobe - Photoshop
* Scanning Technology
* Out put Technology

පාඨමාලා කාලය : මාස 04
මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
දින : සතිපතා සහ සති අන්ත පන්ති කීපයක් පැවැත්වේ.
ගාස්තුව රු. 9,500

ශාඛාවල හඳුන්වා දී ඇති මෙම පරිගණක ආශ්‍රිත රූ රටා නිර්මාණය පිළිබඳ පාඨමාලාව හැදෑරීමෙන් කොළඹ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ප්‍රධාන ශාඛාව මගින් හඳුන්වා දෙන මුද්‍රණ, දෘෂ්‍ය සන්නිවේදන සහ කළමණාකරණ විෂයයන් ආශ්‍රිත උසස් ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීමට අවශ්‍ය මූලික සුදුසුකම් සමහරක් ද සපුරා ගත හැක.

විමසීම් සහ ඇතුළත් වීම් සඳහා පහත ලිපිනයෙන් අමතන්න :

*මාතලේ ශාඛාව* :

සමන්ත කුලතුංග,
පාඨමාලා උපදේශක,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
මාතලේ ශාඛාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.

දුරකථන අංකය : 071-4895044,
060 2683839

*බේරුවල ශාඛාව* :

හරිත වැන්දබෝනා,
පාඨමාලා උපදේශක,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
බේරුවල ශාඛාව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බේරුවල.

දුරකථන අංකය : 034-2279881.
0714-286261

කොළඹ 08 දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ රජයේ මුද්‍රණාලීය ගොඩනැගිල්ලේ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ දුරකථන අංක 2686162 හෝ 2679791 අමතා කථා කිරීමෙන් ද වැඩි විස්තර ලබා ගත හැක.

මෙම පාඨමාලාවට බඳවා ගනු ලබන්නේ සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් නිසා මුලින් ඇතුළත් වන අයට අවස්ථාව සැලසේ.

කොළඹ ප්‍රධාන ශාඛාව :
දුරකථන අංක : 0112-686162, 0112-679791

07-165/2

## ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයේ 2 වැනි පංතියේ, 1 වැනි ශ්‍රේණියේ සිට 1 වැනි පන්තියට උසස් කිරීමේ විභාගය, 2007

ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයේ 2 වැනි පන්තියේ, 1 වැනි ශ්‍රේණියේ සිට එකී සේවයේ 1 වැනි පන්තියට උසස් කිරීම සඳහා පවත්වනු ලබන විභාගය සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද ලියාපදිංචි පිරිවෙන්වල සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවයේ පරිවෙණාචාර්යවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අමාත්‍යාංශය යන්නෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ද සේවය යන්නෙන් ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවය ද නියෝග මාලාව යන්නෙන් ශ්‍රී ලංකා පරිවෙණාචාර්ය සේවා නියෝග මාලාව ද අදහස් කරනු ලැබේ.

02. සුදුසුකම්.-පළමු වැනි පන්තියට උසස් කිරීමේ විභාගයට පෙනී සිටීම සඳහා පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු අතර එම සුදුසුකම් 2004.12.31 දිනට සම්පූර්ණ කර තිබිය යුතුයි.

i. සේවයේ 2 වැනි පංතියේ 1 වැනි ශ්‍රේණියේ පරිවෙණාචාර්ය-වරයෙකු වීම.
ii. සේවයේ 2 වැනි පංතියේ 1 වැනි ශ්‍රේණියේ සේවා කාලය තුළ නියෝග මාලාවේ නියමයන්ට අනුව ලකුණු 05ක් උපයා ගෙන තිබීම.
iii. වෘත්තීය සුදුසුකම් ලබා තිබීම (නියෝග මාලාවේ නියමයන්ට අනුව)

*සටහන :*

i. සේවයේ 2 වැනි පංතියේ 1 වැනි ශ්‍රේණියට අයත් අධ්‍යාපනපති, ශාස්ත්‍රපති (අධ්‍යාපන) අධ්‍යාපන දර්ශනපති හා විද්‍යාපති උපාධිධාරීන් මේ විභාගයෙන් නිදහස් කෙරේ.
ii. ව්‍යවස්ථානුකූලව සුදුසුකම් සපුරන පරිවෙණාචාර්යවරුන් විභාග ප්‍රතිඵල මත උසස්වීම සඳහා සලකා බලනු ලැබේ.

03. *විභාගය පවත්වනු ලබන දිනය :*

විභාගය පවත්වනු ලබන දිනය 2009 ජනවාරි මස වන අතර එය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධ්‍යාපන ලේකම්ට බලය ඇත.

04. *විභාග මධ්‍යස්ථාන :*

පහත සඳහන් නගරවල පිහිටුවනු ලබන මධ්‍යස්ථානවල දී විභාගය පවත්වනු ලැබේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති විභාග මධ්‍යස්ථාන අවලංගු කර වෙනත් මධ්‍යස්ථානවලට යොමු කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි සිදුකරනු ලැබේ. විභාගය පැවැත්වෙන නගර හා නගර අංක ඇතුළත් වගුවට අනුව ඉල්ලුම් පත්‍රයේ 2.0 ශීර්ෂය සම්පූර්ණ කළ යුතුය.

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | අනුරාධපුරය | 12 |
| ගම්පහ | 02 | පොළොන්නරුව | 13 |
| කළුතර | 03 | බදුල්ල | 14 |
| ගාල්ල | 04 | මොණරාගල | 15 |
| මාතර | 05 | රත්නපුරය | 16 |
| හම්බන්තොට | 06 | කෑගල්ල | 17 |
| මහනුවර | 07 | අම්පාර | 18 |
| මාතලේ | 08 | ත්‍රිකුණාමලය | 19 |
| නුවරඑළිය | 09 | මඩකලපුව | 20 |
| කුරුණෑගල | 10 | වවුනියාව | 21 |
| පුත්තලම | 11 | යාපනය | 22 |

සේවා ස්ථානය අයත් පළාත (විභාග නිවේදනයේ 04 (ආ) ඡේදයට අනුව අදාළ අංකය ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන්න)

| | | |
|---|---|---|
| බස්නාහිර පළාත - 1 | ඌව පළාත - 4 | උතුරු මැද පළාත - 7 |
| දකුණු පළාත - 2 | සබරගමුව පළාත - 5 | උතුරු නැගෙනහිර පළාත - 8 |
| මධ්‍යම පළාත - 3 | වයඹ පළාත - 6 | |

05. *ලකුණු සීමා :*

1 වන පන්තියට උසස් කිරීමේ විභාගයේ දී සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම 40% නොඅඩු ලකුණු ප්‍රමාණයක් සමඟ මුළු ලකුණු සංඛ්‍යාව 200ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා අපේක්ෂකයන් අතරින් වැඩි ම ලකුණු ලබාගත්, පුරප්පාඩු සංඛ්‍යාවට ආසන්න සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබයි.

06. *සේවා කොන්දේසි :*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1113/12 දරන 2000 ජනවාරි 4 දින නිකුත් කර ඇති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මාලාවෙහි ඇතුළත් කොන්දේසි ද එම නියෝග මාලාවට කරන ලද සංශෝධන ද රජයේ සේවයේ අදාළ පොදු කොන්දේසි ද උසස් වීම් සඳහා අදාල කරගනු ලැබේ.

07. *විභාගයට පෙනී සිටීමේ මාධ්‍යය :*

i. මේ විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ තමා පරිවෙණාචාර්ය සේවයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලබා ගත් මාධ්‍යයෙනි.

ii. අපේක්ෂකයකු විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍ර වලට එක ම භාෂාවෙන් පිළිතුරු සැපයිය යුතුය.

iii. ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති භාෂා මාධ්‍යය පසු ව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

08. *විභාග ගාස්තු.-*

විභාග ගාස්තු රු. 300 කි. මේ මුදල ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පළමු ආදායම් ශීර්ෂ 4000-20-03-20-13ට බැර කිරීම සඳහා දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලද ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවේ ඇලවිය යුතුය. මොන ම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. (විභාග ගාස්තු ගෙවූ ලදු පතෙහි ඡායා පිටපතක් ඔබ වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය.-*

(අ) ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 1-4 තෙක් පළමුවන පිටුවට ද, 5 සිට 7 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත්, ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු බවත්, 9 (අ) වන ශීර්ෂයෙහි සඳහන් කරන්න. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව හා එම ඉල්ලුම් පත්‍රයේ ඡායාපිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව එම ඡේදයේ ම සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් සඳහන් කරන්න.

(ආ) ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2008 ඔක්තෝබර් 10 වේ. මෙදිනට පෙර ඔබ වහන්සේ/ඔබ සේවය කරන පිරිවෙනේ පරිවේණාධිපති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පැලවත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයේ 2 වැනි පන්තියේ 1 වැනි ශ්‍රේණියේ සිට 1 වන පන්තියට උසස් කිරීම සඳහා පවත්වන විභාගය" යනුවෙන් සඳහන් කළ යුතුය. තැපෑලේ දී ඇතිවන ප්‍රමාදයන් මගහරවා ගැනීම පිණිස කල්වේලා ඇතිව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දෙනු ලැබේ. සෑම ඉල්ලුම් පත්‍රයක ම විභාගයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ඇ) ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඈ) අමාත්‍යාංශයේ හෝ විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පෞද්ගලික නම්වලට එවනු ලබන ඉල්ලුම් පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඉ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2/3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම් පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ලඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

10.1 *විෂයයන් හා විෂය නිර්දේශ :*

| | | *ලකුණු* | *කාලය පැය* |
|---|---|---|---|
| (01) | සාමාන්‍ය දැනීම | 100යි | 01යි |
| (02) | ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යුහය හා තුලනාත්මක අධ්‍යාපනය | 100යි | 03යි |
| (03) | පිරිවෙන් අධ්‍යාපන ව්‍යවහාර | 100යි | 03යි |
| (04) | ප්‍රායෝගික අධ්‍යාපන මනෝවිද්‍යාව හා ශිෂ්‍ය උපදේශනය | 100යි | 03යි |

10.2 විෂයයන් හා විෂය නිර්දේශ :

01. සාමාන්‍ය දැනීම :

ජාතික හා අන්තර්ජාතික වශයෙන් අධ්‍යාපනික, සංස්කෘතික, ආර්ථික, සාමාජික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ යන ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනීම පිළිබඳ වාස්තවික වර්ගයේ ප්‍රශ්න විමසනු ලැබේ.

02. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යුහය හා තුලනාත්මක අධ්‍යාපනය. :

අධ්‍යාපන ව්‍යුහය.-ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික, අධ්‍යාපන පරමාර්ථ, අධ්‍යාපන අවශ්‍යතා සම්පාදනය, අධ්‍යාපනයේ සහභාගීත්වය, ශිෂ්‍ය ප්‍රගතිය ඇගයීම, අධීක්ෂණය, උසස් අධ්‍යාපන අවස්ථා.

මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් 1960න් පසුව ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, රුසියාව, ජපානය යන රටවල් තුළ දක්නට ලැබෙන තුළනාත්මක තත්ත්වයන් පිළිබඳ අවබෝධය හා විනිශ්චය වැඩි අවධානයකට ලක් වේ. අධ්‍යාපනය හා රැකියා සම්පාදනය (පිරිවෙන් අධ්‍යාපන ව්‍යුහය, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ, පිරිවෙන් අධ්‍යාපනයේ විකාශනය පිළිබඳව ද ප්‍රශ්න ඇතුළත් වේ.)

03. පිරිවෙන් අධ්‍යාපන ව්‍යවහාර :

ශිෂ්‍ය සාධනය ඇගයීම, ගැටුම් නිරාකරණය සඳහා අධ්‍යාපනය, විවෘත ඉගෙනුම, පන්ති කාමර හා පිරිවෙන් අධීක්ෂණය, ගුරු වග වීම නිර්ණය කිරීම, අධ්‍යාපන විගණනය, අධ්‍යාපන තාක්ෂණය හා ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය යන සංකල්පය හා සංසිද්ධි සම්බන්ධයෙන් ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ දක්නට ලැබෙන නව ප්‍රවනතා හා ව්‍යවහාර පිළිබඳ අවබෝධය හා විනිශ්චය, ශිෂ්‍ය ශික්ෂණය පිළිබඳ බෞද්ධ විධි ක්‍රම, පුද්ගල විභවතා පදනම් කරගත් කේවල ඉගැන්වීම්.

04. ප්‍රායෝගික අධ්‍යාපන මනෝවිද්‍යා හා ශිෂ්‍ය උපදේශනය :

ළදරු ළමා හා නව යොවුන් වියේ අවශ්‍යතා හැඳින ගැනීම හා එම අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ඉගෙනුම් අවස්ථා සම්පාදනය, ශිෂ්‍ය ප්‍රගතිය ඇගයීම හා පිරිවෙන් පාදක උපදේශන වැඩසටහන්, ඉගෙනුම් සංස්කෘතිය හා ඒ පිළිබඳ ගුරු කාර්යභාරය, පිරිවෙන් තුළ උපදේශන ක්‍රියාවලිය, උපදේශන කාර්යයන් පිළිබඳ ගුරුවරයාගේ භූමිකාව, ඒකීකරණ අධ්‍යාපනය, ශිෂ්‍ය පෞරුෂ වර්ධනය හා ඒ හා සම්බන්ධ ගුරුවරයාගේ කාර්යභාරය, ශිෂ්‍ය ස්වභාවය හා නූතන ශිෂ්‍ය ගැටලු හැඳින ගැනීම, සිසුන් ඉගෙනීමට පෙළඹවීම හා පෙළඹුම් උපාය මාර්ග, ළදරු ළමා හා ගැටවර වියේ විශේෂ සංවර්ධන අවස්ථා හා ලක්ෂණ, ඉහත ක්ෂේත්‍ර පිළිබඳ අවබෝධය හා විනිශ්චය.

මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණක් වේ නම් ඒ පිළිබඳ අවසාන තීරණයක් ගැනීමේ බලය අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

11. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ **පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණකි.**

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

13. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
අධ්‍යාපන ලේකම්.

බත්තරමුල්ල, පැලවත්ත, ඉසුරුපායෙහි පිහිටි,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

07-273

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2009

01. ගුරු විද්‍යාලයන්හි දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අත්සන් කළ විධිමත් පත්වීම් ලබා ඇති රජයේ පාසල්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන්,

1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර ඇති පෞද්ගලික පාසල් නාම ලේඛනයේ ඇතුලත් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති ගුරුවරුන්

1.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති පිරිවෙන් ගුරුවරුන්,

1.4 මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දුරස්ථ හෝ ප්‍රින්සෙට් ගුරු පුහුණු පාඨමාලා හදාරා අසාර්ථක වූ බව දුරස්ථ ගුරු පුහුණු බලධාරීන් විසින් සහතික කර ඇති ගුරුවරුන්.

02. *විශේෂ උපදෙස් :*

2.1 ක්‍රි. ව. 2012 ට ප්‍රථම සියළුම ගුරුවරු පුහුණු කිරීමටත්, ඉන්පසු නියමිත පුහුණුවකින් තොරව පාසලෙහි ඉගැන්වීමට අවස්ථා නොදීමටත් අපේක්ෂා කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන ලේකම්ගේ නිගමනය අවසන් තීරණය වනු ඇත.
ගුරු විද්‍යාලයන්හි පවතින පුරප්පාඩු මත පාසලේ වැඩ භාරගැනීමේ ජ්‍යෙෂ්ඨතාවය පදනම් කරගෙන තෝරා ගැනීම් කෙරේ. නුපුහුණු ගුරුවරුන්ගේ උසස්වීම්වලදි වෘත්තීය සුදුසුකම් නොමැතිවීම නිසා පාඩු සිදුවනවා පමණක් නොව පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය කරගැනීමට ද බාධාවක් වී ඇත. මෙම සියලු කරුණු සලකා නුපුහුණු ගුරුවරු පුහුණුව ලබා ගැනීමට කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

2.2 මෙම පාඨමාලාව අවුරුදු දෙකක නේවාසික පුහුණුවක් වන අතර, නේවාසික පහසුකම් නැති අවස්ථාවල විදුහල්පතිගේ ලිඛිත අවසරය මත ගුරු විදුහලට ආසන්නයේ නේවාසික වීමට අවසර දෙනු ලැබේ.

2.3 ඒ ඒ ගුරු විද්‍යාලයේ පාඨමාලා පැවැත්වීම හා පහසුකම් අනුව ගුරු විද්‍යාලය තිරණය වන බැවින් සෑමවිටම ආසන්න ගුරු විද්‍යාලය ලබාදීමට නොහැකි වේ.

2.4 ගුරු විද්‍යාලයෙහි පුහුණු කාලය තුළ වෙනත් පාඨමාලා හැදෑරීම හෝ බාහිර වෙනත් විභාගවලට පෙනීසිටීම හෝ නොකළ යුතුය. ඒ පිළිබඳ ලැබෙන තොරතුරු හා පාඨමාලා හැරයාම පිළිබඳව විධිමත් පරීක්ෂණයකින් පසු විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

2.5 මෙම පාඨමාලාව පහත දැක්වෙන ගුරුවරුන්ට අදාළ නොවේ.

(අ) කවර හෝ ගුරු විදුහලක දැනටමත් පුහුණුව ලබන්නා හෝ ලබා ඇති ගුරුවරුන්,

(ආ) උපාධිධාරී අභ්‍යාසලාභී ගුරු පත්වීම් හෝ උපාධිධාරී කළමනාකරණ සහායක පත්වීම් හෝ ඒ සමාන කවර හෝ උපාධි පත්වීමක් ලබා ඇති ගුරුවරුන්,

(ඇ) මෙහි අංක 7 හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති ගුරුවරුන්.

ඉහත විස්තර අනුව සුදුසුකම් සපුරා නොමැති අය පාඨමාලාවට ඇතුළත් වී ඇති බව දැන ගැනීමට ලැබුණු අවස්ථාවක පුහුණුවන කාලය තුළ දි නම් පුහුණුව අවලංගු කරන අතර, පුහුණුවෙන් පසුව නම් ඔහුගේ හෝ ඇයගේ ගුරු පුහුණු සහතිකය අවලංගු කරනු ලැබේ.

2.6 සෑම අයදුම්කරුවකු විසින් ම පහත සඳහන් ලියකියවිලි ගුරු පුහුණුව සඳහා ලියාපදිංචිවීමට කැඳවන දිනයේ දී බාරදිය යුතුය.

(අ) සම්පූර්ණ කරන ලද ඇප බැඳුම්කරය,

(ආ) ගුරු අධ්‍යාපන පාඨමාලා නිම කිරීමෙන් පසුව පත්කරනු ලබන පාසල්වල (රජයේ ගුරුවරුන් රජයේ පාසල්වල හා රජයේ නොවන ගුරුවරුන් අදාළ පාලක මණ්ඩලය යටතේ) නොකඩවා අවුරුදු 5 ක් සේවය කරන බවට රජය හෝ පාලක මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක පිටපත.

2.7 1982 අප්‍රේල් මාසයෙන් පසුව දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරු පත්වීම් ලැබ පුහුණුවට ඇතුළත් වන අය ගුරු පුහුණුවෙන් පසුව ද මුල් පත්වීම ලද එම දිස්ත්‍රික්කවල ම සේවය කිරීමට යටත් වන බව ද සැලකිය යුතුය.

2.8 ගුරු පුහුණු පාඨමාලාවක් සඳහා ගුරු විද්‍යාලයකට ඇතුළත්වූ පසු කිසිම පුහුණුලාභියෙකුට තම අභිමතය පරිදි පාඨමාලාවෙන් ඉවත්විය නොහැකි ය. එසේ ඉවත් වුවහොත් රජයේ වියදම් තක්සේරු කර අධිභාරය සමග අයකරනු ලැබේ.

03. i. ගුරු විදුහල්පති විසින් අපේක්ෂා කරනු ලබන තත්ත්වයට නොපැමිණීම සාමාන්‍ය හැසිරීම ගුරු විද්‍යාලයේ විනය ගරුකත්වයට අනුකූල නොවන බව වැටහේ නම් හා ඉගෙනීම පිළිබඳ උද්‍යෝගීතාව දැක්වීමට අපොහොසත් වන්නේ නම් පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් නවතා දමනු ලැබේ. පුහුණුව ලබන ගුරුවරයකුගේ විෂය ක්‍රියාකාරකම්වලට සහභාගි වීම සහ පැමිණීම 90% කට අඩු වුවහොත් ගුරු විද්‍යාල අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත. එහෙත් යම් අවස්ථාවක දී විශේෂ කාරණයක් මත අධ්‍යාපන ලේකම්ගේ තීරණය අනුව මෙයට ඉඩ දිය හැකි ය.

*නිවාඩු :*

ii. ආයතනික පුහුණුව සඳහා වසර දෙකක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. මෙම අධ්‍යයන නිවාඩු කාලය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණයෙන් ම යොදාගැනීම අවශ්‍ය ය. එහෙත් ගුරු පුහුණුව ලබන්නාට අත්‍යාවශ්‍ය බවට විදුහල්පති සෑහීමකට පත්වේ නම් පමණක් සීමිත දින ගණනක් අනියම් නිවාඩු ලබාගත හැකි ය. ඒ සඳහා විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව අවධාරණය කරනු ලැබේ. මෙසේ ලබාගන්නා නිවාඩුව වර්ෂයකට දින දහයක් නොඉක්ම විය යුතු ය.

අධික ලෙස නිවාඩු ගැනීමේ හේතුවෙන් පාඨමාලාව අධ්‍යයන කිරීමේ ප්‍රගතිය අසතුටුදායක බවට කිසියම් අභ්‍යාසලාභියකු පිලිබඳව විදුහල්පති වාර්තා කළහොත් පාඨමාලා අධ්‍යයනය අත්හිටුවා පාසල්වලට ආපසු යවනු ලැබේ. වෛද්‍ය නිවාඩු සඳහා රජයේ හෝ රජය පිළිගත් වෛද්‍යවරයකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

පුහුණුවන කාලය තුළ යම් අභ්‍යාසලාභිනියක් ගර්භනී භාවයට පත්වීම ඇගේ පුහුණුවට බාධාවක් වේ යැයි ඒත්තු යන අවස්ථාවලදී ඇගේ පුහුණු කටයුතු කරගෙන යාම පිළිබඳ තීරණයක් ගැනීමේ අයිතිය අධ්‍යාපන ලේකම් සතු වනු ඇත.

04. ගුරු විද්‍යාලය විසින් පවත්වනු ලබන පරීක්ෂණ වලින් සහ දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් ද සමත්වන අයට ගුරු පුහුණු සහතිකය පිරිනමනු ලැබේ.

05. *වැටුප් පරිමාණය.-* ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළව පසුකාලීන සංශෝධනයන්ට යටත්ව පුහුණු ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පසු අදාළ වන වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

06. (i) සෑම අයදුම්කරුවකු ම තමා පත්වීම ලද විෂයයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය. එහෙත් විශේෂ අධ්‍යාපන පාඨමාලාවට පමණක් වෙනත් විෂයයන්ගෙන් පත්වීම් ලද ගුරුවරුන්ට ද ඉල්ලුම් කළ හැකිය. රජයේ පත්වීම් ලද ගුරුවරුන්ගේ පත්වීම් විෂයය, පත්වීම් ලිපියේ සඳහන් නොවන අවස්ථාවලදී තමා අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත්වූ විෂයයන්ගෙන් ගුරු පුහුණුව ලබාගැනීමට ඉල්ලුම් කළ හැකි ය. ඒ සඳහා අදාළ විෂයයන් උගන්වන බවට අනුමත කාලසටහන් පිටපතක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත බඳවා ගත් අයගේ පත්වීම් ලිපියේ පත්වීම් විෂයය සඳහන් නොවන විටක දී එම පත්වීම ප්‍රාථමික ගුරු පත්වීමක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පෞද්ගලික හා පිරිවෙන් ගුරුවරුන්ගේ පත්වීම් ලිපිවල විෂයය සඳහන් නොවන අවස්ථාවල දී තමන් උගන්වනු ලබන විෂයය අනුව පුහුණුව සඳහා තෝරා ගැනේ. ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුත් අනුමත කාලසටහනේ පිටපතක් ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ii) යම් පාඨමාලාවක් සඳහා අයදුම්කරුවන් ප්‍රමාණවත් පිරිසක් ඉල්ලුම් නොකළහොත් එම පාඨමාලාව පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳව අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

පහත දැක්වෙන පාඨමාලාවලින් එක් පාඨමාලාවක් සඳහා පමණක් අයදුම් කළ යුතුය.

| *පාඨමාලාවේ අංකය* | *පාඨමාලාවේ නම* |
|---|---|
| 01 | සිංහල |
| 02 | ප්‍රාථමික අධ්‍යාපනය |
| 03 | සමාජ විද්‍යාව |
| 04 | විද්‍යාව |
| 05 | ගණිතය |
| 06 | කෘෂි විද්‍යාව |
| 07 | ගෘහ විද්‍යාව |
| 08 | ඉංග්‍රීසි |
| 09 | බුද්ධ ධර්මය |
| 10 | ක්‍රිස්තියානි/රෝමානු කතෝලික ධර්මය |
| 11 | හින්දු ධර්මය |
| 12 | ඉස්ලාම් ධර්මය |
| 13 | චිත්‍ර කර්මය |
| 14 | සංගීතය |
| 15 | නැටුම් |
| 16 | අරාබි |
| 17 | විශේෂ අධ්‍යාපනය (සිංහල මාධ්‍යය)<br>(අ) ශ්‍රවණාබාධිත (බිහිරි) ළමයින්ට ඉගැන්වීමේ ක්‍රම<br>(ආ) දෘශ්‍යාබාධිත (අන්ධ) ළමයින්ට ඉගැන්වීමේ ක්‍රම<br>(ඉ) මන්ද මානසික (බුද්ධිහීන) ළමයින්ට ඉගැන්වීමේ ක්‍රම. |
| 18 | හස්ත කර්මාන්තය හා තාක්ෂණය |
| 19 | වාණිජ |
| 20 | දෙමළ |
| 21 | ශාරීරික අධ්‍යාපනය |
| 22 | දෙවන බස (සිංහල/දෙමළ) |

07. (i) *සුදුසුකම්.-* සෑම අයදුම්කරුවකුට ම පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු ය.

(I) යහපත් චරිතයකින් යුක්ත වීම.

(II) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(III) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය හා මව්බස ඇතුළුව විෂයයන් 6 කින් අ.පො.ස. (සා.පෙළ) හෝ ජා.පො.අ.ස විභාගය සමත් වී සිටිය යුතුය.

(IV) රජයේ පාසල්වල සේවයේ නියුක්ත ගුරුවරුන් 2008.08.15 දින වන විට ගුරුවරයකු ලෙස අවම වශයෙන් මාස තුනක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

(V) සෑම අයදුම්කරුවකු ම තම පත්වීමේ ස්වභාවය මුල් පත්වීම් ලිපිය ඇසුරෙන් සනාථ කළ යුතු ය.

(ii) පහත සඳහන් පාඨමාලා තෝරා ගන්නා අයට ඉහත කී සුදුසුකම්වලට අමතරව මතු දැක්වෙන සුදුසුකම් ද තිබිය යුතු ය.

(අ) සිංහල පාඨමාලාව.- අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ආ) *විද්‍යා පාඨමාලාව.-*

(I) අ.පො.ස. (සා.පෙළ) පැරණි නිර්දේශයේ භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය යන විෂයයන්ගෙන් දෙකකටවත් සම්මාන සාමාර්ථය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම (උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව හෝ සමග ජීව විද්‍යාව ගණන් නොගැනේ) ; හෝ

(II) නව නිර්දේශයේ විද්‍යාව, ගණිතය විෂයයන් සමත්වීම හා විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(III) ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත් වීම.

(ඇ) *ගණිතය පාඨමාලාව :*

(I) අ.පො.ස. (සා.පෙළ) පැරණි නිර්දේශයේ හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී භෞතික විද්‍යාව, ව්‍යාවහාරික ගණිතය, උසස් ගණිතය, මූලික ගණිතය, ශුද්ධ ගණිතය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් දෙකකටවත් සම්මාන සාමාර්ථයන් ලබා තිබීම ; හෝ

(II) අ.පො.ස (සා.පෙළ) නව නිර්දේශයේ ගණිතය හා විද්‍යාව සමත්වීම හා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(III) ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත්වීම.

(ඈ) *කෘෂි විද්‍යා පාඨමාලාව :*

(I) පැරණි නිර්දේශයේ අ.පො.ස. (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(II) අ.පො.ස (සා.පෙළ) නව නිර්දේශයේ විද්‍යාව හා කෘෂි විද්‍යාව සමත් වීම හා කෘෂි විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(III) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සමත්වී තිබීම ; හෝ

(IV) ජා.පො.අ.ස විභාගයේ දී නම් ඉහත සඳහන් විෂයයකට ඒ හෝ බී සාමාර්ථයක් ලබා සිටීම (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයයි) ; හෝ

(V) කෘෂිකර්මය සම්බන්ධයෙන් රජයේ ගොවිපලක මාස 6 කට නොඅඩු කාලයක පුහුණුවක් ලබා තිබීම.

(ඉ) *ගෘහ විද්‍යාව පාඨමාලාව :*

(I) අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ගෘහ විද්‍යාව, මැහුම් වැඩ යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

(II) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ගෘහ විද්‍යාව විෂයය සමත්ව තිබීම ; හෝ

(III) ජා. පො. අ. ස විභාගයේ දී ඉහත කී විෂයයනට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම් විෂය මොනවාදැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ; හෝ

(IV) රජයේ කාර්මික විදුහලක වසරකට නොඅඩු කාලයක් ගෘහ විද්‍යාව හදාරා ලබාගත් සහතිකයක් තිබීම.

(ඊ) *ඉංග්‍රීසි පාඨමාලාව :*

(I) දැනට ඉංග්‍රීසි ගුරු පත්වීමක් ලබා තිබීම ; හෝ

(II) ඉංග්‍රීසි i, ii, හෝ iii පෙළ ගුරු සහතික පත්‍රය ලබා දැනට සේවයේ යෙදී සිටීම ;

සහ

(III) අ.පො.ස (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(IV) ඊට උසස් විභාගයකින් ඉංග්‍රීසි විෂයය සමත්ව තිබීම.

(උ) *ආගම පාඨමාලාව :*

(I) බුද්ධ ධර්මය, රෝමානු කතෝලික ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය යන පාඨමාලාවන් සඳහා ඉල්ලුම් කරන අය තමා හැදෑරීමට බලාපොරොත්තු වන ආගම විෂයයට අ.පො.ස (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(II) ජා. පො. අ. ස විභාගයේ දී ආගම විෂයයට ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(III) ඉහත 1 හි සඳහන් විෂයයකින් හෝ ඊට අදාළ විෂයයකින් අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් සාමාර්ථයක් ලබා තිබීම.

(ඌ) *චිත්‍රකර්ම පාඨමාලාව :*

(I) රජයේ ලලිතකලායතනයේ සහතික පත්‍රය (චිත්‍ර කර්මය පිළිබඳ තුන් අවුරුදු පාඨමාලාව) ; හෝ

(II) චිත්‍රකර්ම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ගුරු සහතික පත්‍රය ; හෝ

(III) අ.පො.ස (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී චිත්‍රකර්ම විෂයය සඳහා සම්මාන සාමාර්ථය ; හෝ

(IV) ජා.පො.අ.ස විභාගයේ දී ඉහත චිත්‍ර කර්මය විෂයයට ඒ හෝ බී සාමාර්ථය (සෞන්දර්යය විෂය කුමක් දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ලබා තිබීම ; හෝ

(V) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

(එ) *සංගීතය පාඨමාලාව :*

(I) ලංකා ගාන්ධර්ව සභාවේ සංගීතය පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග සංගීත විභාගයේ හෝ ජාතික සංගීත විභාගයේ ප්‍රථම විභාගය ; හෝ

(II) රජයේ සංගීත විදුහලේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය ; හෝ

(III) උත්තර ලංකා පෙරදිග සංගීත ගුරුවරුන්ගේ සංගමයේ සංගීතය පිළිබඳ සහතික පත්‍රය (5 වැනි ශ්‍රේණිය) ; හෝ

(IV) පිළිගත් ඉන්දීය සංගීත ආයතනයක සංගීතය පිළිබඳ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය ; හෝ

(V) අ.පො.ස (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේ දී සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක් ; හෝ

(VI) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී සංගීත විෂයයට සාමාර්ථයක් ; හෝ

(VII) ජා.පො.අ.ස විභාගයේ දී සංගීත විෂයයට "ඒ" හෝ "බී" සාමාර්ථය (සෞන්දර්යය විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ලබා තිබීම.

(ඒ) *නැටුම් පාඨමාලාව :*

(I) ලංකා ගාන්ධර්ව සභාවේ නැටුම් පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග නැටුම් විභාගයේ හෝ ජාතික නැටුම් විභාගයේ ප්‍රථම විභාගය ; හෝ

(II) රජයේ නැටුම් විදුහලේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය ; හෝ

(III) පිළිගත් ඉන්දීය නැටුම් ආයතනයක අන්තර් මාධ්‍ය සහතික පත්‍රය ; හෝ

(IV) අ.පො.ස (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී නැටුම් විෂයය සඳහා සම්මාන සාමාර්ථ්‍යය ; හෝ

(V) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී නැටුම් විෂයය සඳහා සාමාර්ථයක් ; හෝ

(VI) ජා. පො. අ. ස විභාගයේ දී නැටුම් විෂයය සඳහා "ඒ" හෝ "බී" සාමාර්ථයක් (සෞන්දර්ය විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි) ලබා තිබීම.

(ඔ) *අරාබි පාඨමාලාව :*

(I) විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල් ආලිම් ප්‍රාරම්භක පරීක්ෂණයේ i වැනි හා ii වැනි පරීක්ෂණය සමත්වීම හෝ අ.පො.ස (සා. පෙළ) විභාගයේ දී අරාබි විෂයයට සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(II) පිළිගත් මද්රසා ආයතනයක අවසාන පරීක්ෂණයෙන් සමත්වීම.

මේ සඳහා මද්රසා ආයතන පහත සඳහන් වේ.

01. බහිජතුල් ඊබ්‍රාහිමියා අරාබි විදුහල, කොටුව, ගාල්ල
02. ගෆූරියා අරාබි විදුහල, මහරගම
03. මද්රසතුල් බාරි අරාබි විදුහල, වැලිගම
04. කාසිමියා අරාබි විදුහල, පුත්තලම
05. නද්වතුල් උලමා අරාබි විදුහල, මුත්තූර්
06. නැගෙනහිර ලංකා අරාබි විදුහල, අඩ්ඩාලච්චේන
07. මදාසතුල්පුලා අරාබි විදුහල, කාත්තන්කුඩි
08. මුස්ලිම් කාන්තා අරාබි විදුහල, කල්එළිය
09. මද්රසතුල් ජිප්රියා අරාබි විදුහල, ගාල්ල
10. හිදාදියා අරාබි විදුහල, මාදම්පේ
11. නද්වතුල් බුහාරි අරාබි විදුහල, කින්නියා
12. මද්රසතුල් නූර්නියා අරාබි විදුහල, කොටුවේගොඩ, මාතර
13. බක්කියා අරාබි විදුහල, ගාල්ල හෝ
14. වෙනත් පිළිගත් ආයතනයක් (සම්මුඛ පරීක්ෂණයේ දී පිළිගත් ආයතනයක් බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.)

(III) ඉහත දැක්වෙන I හෝ II හි සඳහන් සුදුසුකම් සහිත ව වෙනත් ගුරු පත්වීම් ලබා සිටින ගුරුවරුනට ද මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(ඕ) *විශේෂ අධ්‍යාපන පාඨමාලාව :* (සිංහල මාධ්‍යය) මෙම පාඨමාලාවේ අංශ තුනකි.

(I) දෘශ්‍යාබාධිත (අන්ධ) ළමයින්ට ඉගැන්වීම.
(II) ශ්‍රවණාබාධිත (බිහිරි) ළමයින්ට ඉගැන්වීම.
(III) මන්ද මානසික (මන්ද බුද්ධික) ළමයින්ට ඉගැන්වීම.

තමන් කැමති අංශය අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. තෝරා ගැනීමේ දි ඉංග්‍රීසි දැනුම තිබෙන අය පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ක) *හස්ත කර්මාන්ත හා තාක්ෂණ කුසලතා පාඨමාලාව :*

(I) අ.පො.ස (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ;

* ලී වැඩ
* ලෝහ වැඩ
* විවීම්
* මැටි ශිල්පය
* මෝටර් කාර්මික ශිල්පය
* ගුවන් විදුලි කාර්මික ශිල්පය
* පෙදරේරු ශිල්පය යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(II) ජා. පො. අ. ස විභාගයේ දී නම් අදාළ විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම. (ප්‍රාග් වෘත්තීය විෂයය කුමක්දැයි විදුහල්පතිගේ සහතිකයක් අවශ්‍යය) ; හෝ

(III) රජයේ කාර්මික විද්‍යාලයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක් යටතේ පවත්වන අවුරුද්දකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා ලබාගත් පුහුණු සහතිකයක් තිබීම.

(ග) *වාණිජ පාඨමාලාව :*

(I) අ.පො.ස (සා.පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, ගණකාධිකරණය, යතුරු ලියනය, ලඝු ලේඛනය, වාණිජ්‍යය හා මුල්‍ය යන විෂයයන්ගෙන් දෙකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(II) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ඉහත සඳහන් විෂයයන් දෙකක් සමත්ව තිබීම ; හෝ

(III) රජයේ කාර්මික විද්‍යාලයක එක් අවුරුදු වාණිජ්‍යය පාඨමාලා සහතිකය ලබා තිබීම.

(ජ) *දෙමළ පාඨමාලාව :*

(I) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ට) *ශාරීරික අධ්‍යාපන පාඨමාලාව :*

(I) දැනට ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරු පත්වීමක් ලබා තිබීම.

(ඩ) *සමාජ විද්‍යාව පාඨමාලාව :*

(I) සමාජ අධ්‍යයනය විෂයයට අ.පො.ස (සා.පෙ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(II) ජා. පො. අ. ස. විභාගයේ දී සමාජ අධ්‍යයනය විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම ; හෝ

(III) භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහාවත් අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී සාමාර්ථ්‍යතාව ලබා තිබිය යුතුය.

(න) *දෙවන බස (සිංහල/දෙමළ).-*

ඉහත 7 (1) හි සඳහන් සුදුසුකම් ඇති දෙවන බස (සිංහල/දෙමළ) විෂය සඳහා පත්වීම් ලද ගුරුවරුන්ට මේ පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

08. අධ්‍යක්ෂ පාලිත පාසලක අනුමත ගුරු මණ්ඩලයක සේවය කරන හෝ පිළිගත් පෞද්ගලික පාසලක ස්ථිර ගුරු මණ්ඩලයක සේවයේ නියුක්ත සාමාන්‍ය පන්තිවල සතියකට පැය 20 ක් ඉගැන්වීම් කරන ගුරු භවතුන් අතුරෙන් සීමිත සංඛ්‍යාවක් පුහුණුව සඳහා තෝරාගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පාසල් පෞද්ගලික පාසල් වශයෙන් සලකනු ලැබේ.

(I) 1951 වර්ෂයේ දී ගාස්තු අය කිරීමේ පාසල් බවට පත්වූ උපකෘත පාසල්.
(II) 1960.12.01 වැනි දිනට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත්වූ පාසල්.
(III) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් (ප්‍රාදේශීය/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නොවේ) අනුමත කර ඇති පෞද්ගලික පාසල් හා පිරිවෙන්.

සියලුම පෞද්ගලික පාසල්වල සේවය කරන අයදුම්කරුවන්ට 2008.08.15 වැනි දිනට අවම වශයෙන් අවුරුද්දක අඛණ්ඩ සේවයක් තිබිය යුතු අතර, ඔවුන්ගේ පළමු පත්වීමේ ලිපිය හා අදාළ ගුරු භවතා අනුමත ගුරු මණ්ඩලයට අයත් බවට සහතික කරන ලද ලිපියක් අදාළ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට 2008.08.15 වැනි දිනට අවම වශයෙන් අවුරුදු දෙකක (02) සේවයක් තිබිය යුතු ය. 1959 පිරිවෙන් පනත හෝ 1979 අංක 64 දරන පනත යටතේ අනුමත සේවය මේ සඳහා ගණන් ගනු ලැබේ.

දැනට පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට ඉල්ලුම් කළ හැක්කේ සිංහල, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා බුද්ධ ධර්මය යන පාඨමාලාවන්ට පමණි. (පත්වීම් ලද විෂයයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය.) විද්‍යායතන පිරිවෙන්වල උගන්වන අනුමත ගුරුවරුන්ට පමණක් මීට අමතරව සංගීතය, චිත්‍ර, නැටුම්, වාණිජ්‍ය, ශාරීරික අධ්‍යාපනය සහ කෘෂිවිද්‍යාව යන පාඨමාලා සඳහා ද ඉල්ලුම් කළ හැකි ය.

සියලු ම පෞද්ගලික පාසල් ගුරුවරුන් පාලක මණ්ඩලයේ කළමනාකරුගෙන් ද පරිවෙන් ගුරුවරුන් කෘත්‍යාධිකාරීන්ගෙන් ද පහත සඳහන් කරුණුවලට අදාළ ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය :

(I) පුහුණුවන කාලයේ දී ගුරු භවතා සේවයෙන් නිදහස් කළ හැකි බවට,
(II) පුහුණුවන කාලය තුළ ගුරු භවතාට වැටුප් ගෙවන බවට,
(III) පුහුණුව අවසානයේ දී පාලක මණ්ඩලය විසින් අදාළ ගුරු භවතා නැවත සේවයේ යොදවා ගන්නා බවට,
(IV) පුහුණුව සඳහා තෝරා ගන්නා පරිවෙන් ගුරු භවතුන් වෙනුවට වෙනත් ගුරු භවතුන් නොඉල්ලන බවට හා ඔහුගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවට.

පෞද්ගලික පාසල් හා පිරිවෙන්වලින් තෝරා ගන්නා ගුරුවරුන් පුහුණුව සඳහා ලියාපදිංචි වීමට පෙර "පුහුණුවෙන් පසු රජයේ පාසල්වල රැකියා නොඉල්ලන බවට" පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුය.

පෞද්ගලික පාසල්වලින් ඉදිරිපත් වන ගුරුවරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කළ මුල් පත්වීම් ලිපි ඉදිරිපත් කළ යුතු ය. වයස අවු. 18 ට පෙර පත්වීම් ලබා සිටින ගුරුවරුන්ගේ පත්වීම් දිනය ගණන් ගැනෙනුයේ අවුරුදු 18 සම්පූර්ණ වූ දින සිට ය. වෙනත් නිලධාරියෙකු මෙම පත්වීම් ලිපිය අත්සන් කර ඇත්නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සත්‍ය බවට සහතික කර තිබිය යුතුය.

09. *තෝරා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම :*

(I) මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් පිළියෙළ කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතු ය.

(අ) ගුරු අධ්‍යාපන පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන මාධ්‍යයෙන් අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ආකෘති පත්‍රය 8" x 12" කඩදාසියක දෙපැත්තේ පිළියෙළ කළ යුතු ය.

(ඇ) කිසිම කොටුවක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන් කළ යුතු අතර එකිනෙකට ගොඩ ගැසෙන සේ පිළියෙළ නොකළ යුතු ය.

(II) අයදුම්කරු විසින් අයදුම්පත්‍රය නොඅඩුව හා නිවැරදිව පිරවිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) සෑම අයදුම්කරුවකු ම තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදිම සඳහන් කළ යුතු ය.

(ආ) තම පාසලේ ප්‍රධානියා මගින් අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. පාසලේ ප්‍රධානියකු ඉල්ලුම් කරන්නේ නම් කොට්ඨාස/කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) යාපනය දිස්ත්‍රික්කයේ නුපුහුණු ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර (ඉංග්‍රීසි ද ඇතුළුව) 'විදුහල්පති, ගුරු විදුහල, කෝපායි' යන ලිපිනයට ද, දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම් කරන මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර දිස්ත්‍රික්කවල නුපුහුණු ගුරුවරුන්ගේ අයදුම් පත්‍ර (ඉංග්‍රීසි හැර) 'විදුහල්පති, ගුරුවිදුහල, මඩකලපුව' ලිපිනයටද, දෙමළ මාධ්‍යයෙන් ඉල්ලුම් කරන මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් දිස්ත්‍රික්කයන්හි නුපුහුණු ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර (ඉංග්‍රීසි හැර) 'පීඨාධිපති, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, වව්නියාව' ලිපිනයට ද එවිය යුතු ය.

(ඈ) ඉහත සඳහන් දිස්ත්‍රික්කවල හැර අනෙකුත් දිස්ත්‍රික්කවල සියලු ම දෙමළ මාධ්‍ය අයදුම්පත්‍ර හා සියලුම සිංහල මාධ්‍යය අයදුම් පත්‍ර (ඉංග්‍රීසි ද ඇතුළුව) හා මඩකලපුව, ත්‍රිකුණාමලය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගේ ඉංග්‍රීසි පාඨමාලාවේ අයදුම්පත්‍ර ද, "ප්‍රධාන කොමසාරිස්, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතු ය.

(ඉ) සියලුම අයදුම් පත්‍ර 2008.08.15 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් අදාළ ලිපිනයන්ට එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ගුරු පුහුණුව සඳහා තෝරා ගැනීම .................... 2009 පාඨමාලාව ........................................ මාධ්‍යය ........................................... දිස්ත්‍රික්කය ............................ "සඳහන් කරන්න.

(ඊ) ප්‍රමාද වී ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලබන අතර,

(I) අයදුම්පත්‍රය ලැබුණු බවට දන්වනු නොලැබේ.
(II) අයදුම් පත්‍රයට සෙසු ලියවිලි අමුණා නොඑවිය යුතු ය.
(III) සුදුසුකම් පරීක්ෂා කිරීමට පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයේ දී සියලු ම සහතික හා ලිපි ලේඛනවල මුල් පිටපත් සහ සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම් ව සිටිය යුතු ය.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2008 ජුනි 13 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

(8" x 12" කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගන්න)

අධ්‍යාපන අමාත්‍යාංශය

**ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරාගැනීම - 2009**

01. මාධ්‍යය : [ ]

02. මුල් පත්වීමේ ලිපිය අනුව පාසලේ වැඩ භාරගත් දිනය : [ ]

03. පාඨමාලාව : [ ]

04. මුල් පත්වීමේ ස්වභාවය (විෂයය සඳහන් කරන්න) : [ ]

05. ඔබ දුරස්ථ ගුරු පුහුණුව ලැබුවේ නම් ;

(I) පාඨමාලාව :————.
(II) වර්ෂය :————.
(III) අවසාන විභාග ප්‍රතිඵල :————.

06. සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය මුලට)

07. මුලකුරු සමග නම :————. හිමි/මයා/මිය/මෙවි.
(භාවිතා කරන ආකාරයට)

08. ස්ත්‍රී/පුරුෂ භාවය [ ]

09. රාජකාරී ලිපිනය :————.

10. සේවය කරන පාසලේ වර්ගය (රජයේ ද/වතු පාසල් ද/පිරිවෙන් ද අනුමත පෞද්ගලික පාසල් ද යන වග) [ ]

11. පෞද්ගලික ලිපිනය :————.
පෞද්ගලික දුරකථන අංකය/ඇමතුමක් දියහැකි දුරකථන අංකය : [ ]

12. උපන් දිනය :————.
2008.08.15 වැනි දිනට වයස
අවුරුදු :————. මාස :————. දින :————.

13. සේවය කරන පාසල අයත් :
(I) දිස්ත්‍රික්කය : [ ]
(II) කලාප අධ්‍යාපන කාර්යාලය : [ ]

14. අධ්‍යාපන සුදුසුකම් :

(I) අ.පො.ස (සා.පෙ)/ජා.පො.අ.ස. විභාග ප්‍රතිඵල :

| | පළමුවර | දෙවනවර |
|---|---|---|
| විභාග අංකය : | | |
| වර්ෂය : | | |
| සාමාර්ථය ලත් විෂයයන් | ලබාගත් ශ්‍රේණිය | |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

(II) අ.පො.ස (උ. පෙළ) ප්‍රතිඵල :

| | පළමුවර | දෙවනවර |
|---|---|---|
| විභාග අංකය : | | |
| වර්ෂය : | | |
| සාමාර්ථය ලත් විෂයයන් | ලබාගත් ශ්‍රේණිය | |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

(III) ඉල්ලුම් කරන පාඨමාලාවට අදාළ යම් අමතර අධ්‍යාපන සුදුසුකම් :

| ආයතන | විෂයය | කාල සීමාව | සහතිකය |
|---|---|---|---|
| | | | |

15. සේවා විස්තරය :

| සේවය කළ පාසල | සේවා කාලය | දුෂ්කර ද නැද්ද යන වග |
|---|---|---|
| | | |

මෙහි සපයා ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි. අසත්‍ය තොරතුරු සපයා ඇති බව ඔප්පු වුවහොත් පුහුණු වන කාලයේ දී ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලබන තීරණය පිළිගනිමි. පාසලේ ගුරු සහ සිසු සංඛ්‍යාව අනුව ද සේවයේ අවශ්‍යතාව අනුව ද මා තෝරා ගැනීම හෝ නොගැනීම තීරණය වන බව ද දනිමි.

දිනය :———.

————,
අයදුම්කරුගේ අත්සන.

ගුරුවරයකු සම්බන්ධයෙන් විදුහල්පති විසින් ද විදුහල්පතිවරයකු සම්බන්ධයෙන් නම් කලාප භාර නි.අ.අ. විසින් ද පහත කොටස සම්පූර්ණ කළ යුතුය.

(I) දැනට ගුරු මණ්ඩලයේ සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව :———.

(II) ශිෂ්‍ය සංඛ්‍යාව :———.

(III) අයදුම්කරු ගුරු පුහුණුව සඳහා නිදහස් කළහොත් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසලේ සිටින ගුරු හවතුන් සංඛ්‍යාව ප්‍රමාණවත් ද ? :———.

............................................................ අයදුම්කරු මගේ පාසලේ/කලාපයේ ගුරුවරයකු/විදුහල්පතිවරයෙකු බවත්, ඔහු/ඇය ......................... දින මුල් පත්වීම අනුව ...................... දින වැඩ භාරගෙන ඇති බවත් ................................ දින සිට ................................ මේ දක්වා මෙම පාසලේ සේවය කරන බවත් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර මවිසින් පරීක්ෂා කර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

————,
විදුහල්පති/කලාප භාර නි.අ.අ.ගේ
අත්සන.

නිල මුද්‍රාව :———.
දිනය :———.

07-285